ලෝක ළමා දින ජාතික සැමරුම - 2021

**කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය**

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

කෙටි ළමා චිත්‍රපට තරගාවලිය (සීමිත/විවෘත) – 2021

## 1. හැදින්වීම

ළමයින් යනු මානව ප්‍රජාවේ අනාගත දිශානතිය තීරණය කරනු ලබන නියමුවන් වේ. ඔවුන් ආරක්ෂා කරමින් දැනුමෙන් කුසලතාවන්ගෙන් සහ සාධනීය ආකල්පවලින් හෙබි මනා පෞරුෂයක් වර්ධනය කරනු වස් ළමුන් උදෙසා සුවිශේෂී දිනයක් ප්‍රකාශයට පත් කිරීමට එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් ගනු ලබන තීරණයට අනුව සෑම වසරකම ඔක්තෝබර් 01 දින විශ්ව ළමා දිනය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

මෙම තීරණය පදනම් කොට ගෙන විවිධ රටවල් සැමරුම් දින සංවිධානය කරන අතර එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාත්මක කරනු ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව ද ඔක්තොබර් 01 දින විශ්ව ළමා දිනය ලෙස නම් කර ඇති අතර ජාතික සැමරුම් උළෙල සෑම වසරක ම පවත්වනු ලබයි.

මෙවර විශ්ව ළමා දින ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ මගපෙන්වීම යටතේ පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ජාතික උළෙල කොළඹ නෙළුම් පොකුණ පරිශ්‍රයේ දී 2021 ඔක්තෝබර් 01 දින පැවැත්වෙන අතර සමගාමී වැඩසටහන් මාලාවක් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රියාත්මක කෙරේ.

නවමු වූ මානයක් තුළින් ඔප් නැංවෙන ළමුන්ගේ නිර්මාණශීලී අදහස්, ශ්‍රී ලාංකේය ළමා පරපුරේ අයිතීන් සුරක්ෂිත කිරීමේ ජාතික ප්‍රවේශ සමග ඒකායනය කිරීම පෙරදැරි ව කෙටි චිත්‍රපට තරගාවලියක් මෙම ජාතික වැඩසටහන් මාලාවට අන්තර්ගත කර ඇත.

මෙම වැඩසටහන විවෘත සහ සීමිත ලෙස කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක කරන අතර සීමිත තරගය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ළමා සමාජ අතර අන්තර් ළමා සමාජ තරගයක් ලෙසත්, විවෘත තරගය පාසල්, දහම් පාසල්, විශ්වවිද්‍යාල ආදී ආයතන මෙන් ම පුද්ගලික අයදුම්කරුවන් සඳහා ක්‍රියාත්මක වේ.

## 2. පරමාර්ථය:

- නිර්මාණාත්මක කෙටි චිත්‍රපටයක් අනුසාරයෙන් ළමුන් විසින් රැගෙන එනු ලබන සමාජීය පරිකල්පන උදෙසා ජාතික මට්ටමේ ඇගයීමක් ලබාදීම සහ ළමුන්ගේ කුසලතා අගය කිරීම.

## 3. අරමුණු:

- ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව තුළ සංවේදී බවක් ඇති කරමින් ළමුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය සමාජ ව්‍යූහ සහ සමාජ ජාලා ශක්තිමත් කිරීම
- ළමුන්ගේ නිර්මාණශීලීත්වය ජාතික මට්ටමින් ඇගයීමට ලක් කිරීම
- ළමුන් උදෙසා තම අයිතීන් වෙනුවෙන් සාමූහික හඬක් අවදි කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම

## 4. වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය:

**පළමු අදියර :**

- දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් මාර්ගයෙන් ළමා සමාජ සහ සෙසු විවෘත කාණ්ඩයට අයත් අංශ වෙත මෙම තරගය පිළිබඳ දැනුම් දීම
- මෙම කෙටි චිත්‍රපටය සකස් කිරීම සඳහා විශේෂයෙන් සීමිත තරගයට සහභාගී වන ළමුන්ට අවශ්‍ය දැනුම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් වෙනත් ආයතනවල සහයෝගයෙන් ලබාදිය හැකිය.

- විවෘත තරගයට සහභාගී වන ළමුන් සඳහා සුවිශේෂී වැඩමුළු පැවැත්වීම හෝ උපදෙස් ලබා දෙමින් ළමුන්ට මඟ පෙන්වීම ඒ ඒ ආයතනවල කාර්යභාරය වේ.
- සීමිත තරගය සඳහා පහත සඳහන් රීතීන්වලට යටත් ව එක් දිස්ත්‍රික්කයකින් අවම වශයෙන් කෙටි චිත්‍රපට 3ක් වත් ඉදිරිපත් කළ යුතුය.
- විවෘත තරගය සඳහා එවැනි සීමාවක් නොමැත.

දෙවන අදියර:

- සීමිත සහ විවෘත යන අංශ දෙක යටතේ ඉදිරිපත් කරනු ලබන කෙටි චිත්‍රපට ප්‍රාමාණික වෘත්තිකයන්ගෙන් සැදුම් ලත් මණ්ඩලයක් විසින් විනිශ්චය කරන ලදු ව පහත සඳහන් අංග උදෙසා ජයග්‍රාහකයින් තෝරා ගනු ලබයි.
- ජයග්‍රාහකයින් සඳහා විශ්ව ළමා දින ජාතික උළෙලේ දී ත්‍යාග සහ සහතිකපත් පිරිනැමේ.
- ජයග්‍රහණය කරන ලද කෙටි චිත්‍රපට දෙක (02) ජාතික දින උළෙලේදී ප්‍රදර්ශණය කරනු ලබයි.
- ජයග්‍රහණය කළ කෙටි චිත්‍රපට දිස්ත්‍රික්ක වශයෙන් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සමගාමී වැඩසටහන්වල ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කිරීම
- මෙම ජයග්‍රාහී කෙටි චිත්‍රපට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා දායක කර ගනු ලබයි.
- දිස්ත්‍රික්කය තුළ ජයග්‍රහණය කළ කෙටි චිත්‍රපට නව මාධ්‍ය ප්‍රවේශ ඇසුරෙන් දේශීය මෙන් ම විදේශීය ප්‍රේක්ෂකයන් වෙත ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කිරීම.

5. කෙටි චිත්‍රපටය නිර්මාණය කිරීම සඳහා උපදෙස්:
    - එක් ළමා සමාජයකින් එක් කෙටි චිත්‍රපටයක් පමණක් සකස් කිරීම
    - කෙටි චිත්‍රපටියේ දර්ශන කාලය විනාඩි 05 ක අවමයක සිට විනාඩි 15 ක උපරිමයක් දක්වා සීමා කිරීම
    - සජීව රංගන (Live Action) හෝ සජීවිකරණය (Animation) හෝ ආකාරයෙන් ඉදිරිපත් කිරීම
    - මාතෘකාවට වඩාත් උචිත සංදර්භයක් තුළ කෙටි චිත්‍රපටය ගොඩ නැගීම
    - ජංගම දුරකථන හෝ වඩාත් පහසු තාක්ෂණයක් ඔස්සේ මෙය නිපදවා තිබීම
    - කෙටි චිත්‍රපටය HD Resolution : 1280 x 720 තාක්ෂණ ප්‍රමිතියෙන් පමණක් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

6. කෙටි ළමා චිත්‍රපට සඳහා යෝජිත විෂය ක්ෂේත්‍රයන් :
    - අන්තර්ජාල භාවිතය තුළ ළමුන්ගේ ආරක්ෂාව
    - සමාජ අභිවෘද්ධිය සඳහා අර්ථාන්විත ළමා සහභාගීත්වය
    - සමානාත්මතාවය තුළ ගොඩ නැගෙන සමාජ සංහිඳියාව
    - ළමා ලෝකය මත් උවදුරින් බේරා ගනිමු
    - යහපත් දෙමාපිය භාවයක් සහිත ව වැඩෙන ළමුන්ගේ පෞරුෂත්ව වර්ධනය
    - සැමට අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරමු

7. ජයග්‍රහණ නාමාවලිය:
    - ප්‍රශස්තතම චිත්‍රපටය - සජීව රංගන - සීමිත
    - ප්‍රශස්තතම චිත්‍රපටය - සජීවීකරණ - සීමිත
    - ප්‍රශස්තතම චිත්‍රපටය - සජීව රංගන - විවෘත
    - ප්‍රශස්තතම චිත්‍රපටය - සජීවීකරණ - විවෘත
    - ප්‍රශස්තතම තිරරචනය - සීමිත
    - ප්‍රශස්තතම තිරරචනය - විවෘත
    - ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීව රංගන - සීමිත
    - ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීවීකරණ - සීමිත
    - ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීව රංගන - විවෘත
    - ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීවීකරණ - විවෘත
    - ප්‍රශස්තතම නළුවා
    - ප්‍රශස්තතම නිළිය
    - ප්‍රශස්තතම කැමරාකරණය

- ප්‍රශස්තතම කලා අධ්‍යක්ෂණය
- ප්‍රශස්තතම අංග රචනය
- ප්‍රශස්තතම සජීවීකරණය
- ප්‍රශස්තතම ශබ්ද සැලසුම්කරණය
- ප්‍රශස්තතම සංස්කරණය
- ප්‍රශස්තතම සංගීතය
- ජූරියේ අගැයීම්

**8. කොන්දේසි:**

තරගයට අදාල කොන්දේසි සහ අයදුම්පත ඇමුණුම් 01 සහ 02 ලෙස මේ සමඟ අමුණා ඇත.

# ලෝක ළමා දින ජාතික සැමරුම - 2021

## කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## කෙටි ළමා චිත්‍රපට තරගාවලිය (සීමිත/විවෘත) – 2021

### තරග කොන්දේසි

1. සෑම අයදුම්කරුවෙකු ම ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
2. සීමිත තරගය පැවැත්වෙන්නේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ළමා සභා /ළමා සමාජවල ළමුන් සඳහා වන අතර එය අන්තර් ළමා සමාජ තරගයක් සේ ක්‍රියාත්මක වේ.
3. විවෘත තරගය සඳහා පෞද්ගලික මට්ටමින් / කණ්ඩායම් ලෙස / පාසල් මට්ටමින් හෝ වෙනත් ළමා සංවිධාන මට්ටමින් ඉදිරිපත් විය හැක.
4. තරගය සඳහා සහභාගීවන තරගකරුවන් වයස අවු 18 වඩා අඩු වීම (විවෘත තරගය සඳහා වයස් සීමාවන් අදාල නොවේ)
5. භාෂාව: සිංහල දෙමළ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයකින් මෙන් ම දෙබස් රහිත ව වුව ද ඉදිරිපත් කළ හැකිය.
6. කෙටි චිත්‍රපටයේ ධාවන කාලය විනාඩි 05 ක අවමයක සිට විනාඩි 15 ක උපරිමයක් දක්වා සීමා වීම.
7. තාක්ෂණය : අවම වශයෙන් HD Resolution : 1280 x 720 ප්‍රමිතියෙන් යුතු ව ඉදිරිපත් කිරීම
8. ළමා සමාජයක්/පාසලක් හෝ වෙනත් ළමා සංවිධානයක් නියෝජනය කරමින් තරගයට ඉදිරිපත් වන්නේ නම් ඔබගේ නිර්මාණය අදාල පාසලේ විදුහල්පතිවරයා හෝ ළමා සමාජයක් නම් ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් ළමා සංවිධානයක් නම් අදාල ප්‍රධාන නිළධාරියෙකු විසින් සහතික කළ යුතු වීම
9. නිර්මාණයේ අයිතිය දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවරු කර ලබාදිය යුතු ය.
10. ත්‍යාග ප්‍රදානය පහත පරිදි වේ.

| අංගය | ප්‍රදාන |
|---|---|
| • ප්‍රශස්තතම චිත්‍රපටය - - සීමිත - මුදල් ත්‍යාගය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම චිත්‍රපටය - සජීවිකරණ - සීමිත - මුදල් ත්‍යාගය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම චිත්‍රපටය - - විවෘත - මුදල් ත්‍යාගය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම චිත්‍රපටය - සජීවිකරණ - විවෘත - මුදල් ත්‍යාගය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම තිරරචනය - සීමිත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම තිරරචනය - විවෘත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීව රංගන - සීමිත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීවිකරණ - සීමිත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීව රංගන - විවෘත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම අධ්‍යක්ෂණය - සජීවිකරණ - විවෘත | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම නළු චරිතය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම නිළිය චරිතය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම කැමරාකරණය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම කලා අධ්‍යක්ෂණය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම අංග රචනය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම සජීවිකරණය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම ශබ්ද සැලසුම්කරණය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම සංස්කරණය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ප්‍රශස්තතම සංගීතය | සම්මානය සහ සහතික පත්‍රය |
| • ජූරියේ ඇගයීම | සහතික පත්‍ර |

11. කෙටි චිත්‍රපට තරගාවලිය සඳහා කෘතීන් භාරගන්නා අවසාන දිනය : 2021. 08. 15.

12. කෙටි චිත්‍රපට එවිය යුතු ලිපිනය:
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
3 වන මහළ, බී කොටස
සෙත්සිරිපාය ii  අදියර, බත්තරමුල්ල

13. ප්‍රශස්තතම කෙටි චිත්‍රපට ලෙස ජයග්‍රහණය ලද කෘතීන් අතුරින් තෝරාගත් නිර්මාණ 2021.10.01 දිනට යෙදී ඇති විශ්ව ළමා දින සැමරුම් උළෙලේදී ප්‍රදර්ශනය කෙරේ.

14. ත්‍යාග ප්‍රදානය ද එදින ම සිදු කෙරේ.

**මේ පිලිබඳ වැඩි විස්තර සඳහා:**
**ජේ.එල්.කිත්සිරි - ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී**
**011 -2186062 /0714392846/0769905750**

සුධිර නිලංග විතාන
**කොමසාරිස් (වැඩ ආවරණ)**

# ලෝක ළමා දින ජාතික සැමරුම - 2021
## කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
## කෙටි ළමා චිත්‍රපට තරගාවලිය (සීමිත/විවෘත) – 2021
## <u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

| ඉදිරිපත් කරන කාණ්ඩය | | | |
|---|---|---|---|
| සීමිත | | සජීවී රංගන | |
| විවෘත | | සජීවිකරණ | |

1. කෙටි චිත්‍රපටයේ නම : ..........................................................................................................
2. ධාවන කාලය : විනාඩි - ............................................ තත්පර - ...............................................
3. නිෂ්පාදනය කළ වර්ෂය : ..........................................................................................................
4. HD Resolution : 1280 x 720 තාක්ෂණ ප්‍රමිතියෙන් ඉදිරිපත් කරමි/නොකරමි :............................................
5. නිර්මාණය පිළිබඳ තොරතුරු -

   I. අධ්‍යක්ෂවරයාගේ නම : ..........................................................................................................

   II. නියෝජනය කරන පාසලේ/ළමා සමාජයේ /වෙනත් ආයතනයේ නම : ..............................................

   ..........................................................................................................

   III. ලිපිනය : ..........................................................................................................

   ..........................................................................................................

   IV. උපන් දිනය (අවුරුද්ද/මාසය/දිනය) : ......................................

   V. අයදුම්පත ඉදිරිපත් කරන දිනට වයස (අවුරුදු/මාස/දින) : ......................................

   (සත්‍ය පිටපතක් බවට සහතික කළ උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබීම අත්‍යවශ්‍ය වේ.)

   VI. පෞද්ගලික ලිපිනය : ..........................................................................................................

   ..........................................................................................................

   VII. දුරකථන අංකය : ස්ථාවර - ............................................ ජංගම - ..............................................

   VIII. විද්‍යුත් තැපැල : ..........................................................................................................

6. ශිල්පීන්ගේ තොරතුරු :

| තාක්ෂණ ශිල්පීන් | ශිල්පියාගේ නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| අධ්‍යක්ෂණය | | | |
| තිර රචනය | | | |
| කැමරාකරණය | | | |
| කලා අධ්‍යක්ෂණය | | | |
| අංග රචනය | | | |
| සජීවීකරණය | | | |
| ශබ්ද සැලසුම්කරණය | | | |
| සංස්කරණය | | | |
| සංගීතය | | | |
| රංගන ශිල්පීන් | ශිල්පියාගේ නම සඳහන් කොට චරිතයේ නම ද වරහන් තුළ දක්වන්න | ලිපිනය | දුරකථන අංකය |
| ප්‍රධාන නළු චරිතය | | | |
| ප්‍රධාන නිළි චරිතය | | | |
| සහාය නළු චරිතය | | | |
| සහාය නිළි චරිතය | | | |

ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, අසම්පූර්ණ අයදුම්පතක් ඉදිරිපත් කිරීම මෙන් ම අපේක්ෂිත තාක්ෂණ ප්‍රමිතියෙන් බැහැර ව නිර්මාණය ඉදිරිපත් කිරීම නිසා කෙටි චිත්‍රපටය තරගාවලියෙන් ඉවත් කිරීමට සංවිධායකයින්ට අයිතිය ඇති බවට පිළිගන්නා බවත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය බවට පිළිගන්නා බවත් ප්‍රකාශ කර සිටිමි.

දිනය : .................................................. ..................................................

අධ්‍යක්ෂකගේ අත්සන

------------------------------------------------------------------------------------------------------------------------

**විදුහල්පති/අනුශාසක/ආයතන ප්‍රධාන නිලධාරියාගේ සහතිකය**

උක්ත සඳහන් ................................................ නමැති කෙටි චිත්‍රපටය අධ්‍යක්ෂණය කළ

............................................. ............................................................................ නැමැති දරුවා මෙම

ආයතනයේ ............................. වසරේ ඉගෙනුම ලබන බවටත්, එම නිර්මාණය ඔහුගේ/ඇයගේ ම ස්වතන්ත්‍ර

නිර්මාණයක් බවටත් සහතික කරමි.

දිනය : ........................................... ..................................................

විදුහල්පති/අනුශාසක/අධීක්ෂණ නිලධාරියා